# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1646/2 - 2010 මාර්තු 22 වැනි සඳුදා - 2010.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් පාලන නිවේදන

**උතුරුමැද පළාතේ පළාත් සභාව**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව ) පනත

1989 අංක 12 දරන පළාත් සභා ( ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ ) 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උතුරුමැද පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය බර්ටි ප්‍රේමලාල් දිසානායක වන මා විසින් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා ) පනතේ 2 වන වගන්තිය යටතේ සාදන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සැදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු 126 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ද බලය ලැබී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා ) පනතේ 2 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට සියළුම ප්‍රාදේශීය සභාවලට මෙයින් බලය දෙනු ලැබේ.

බර්ටි ප්‍රේමලාල් දිසානායක,
උතුරුමැද පළාතේ පළාත් සභාවේ
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2010 ජනවාරි මස 01 වැනි දින,
අනුරාධපුරයේ දී ය.

**අතුරු ව්‍යවස්ථා**

01. මේ අතුරු ව්‍යවස්ථා " ප්‍රජා මූල සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථා " යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. (1) යම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් තුල, ජල සම්පාදන හා ජල කර්මාන්ත ව්‍යාපාරයක් පවත්වාගෙන යන (මෙහි මින් මතු "ප්‍ර.මූ. ස." යනුවෙන් සඳහන් කරනු ලබන ) ප්‍රජා මූල සංවිධානයකට අවශ්‍ය සහාය ලබාදීම එම ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය.

(2) "ප්‍ර.මූ. ස." විසින් යම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් තුළ, ජල සම්පාදන හා ජල කර්මාන්ත ව්‍යාපාරයක් ස්ථාපනය කිරීමට පෙර අදාල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

(3) යම් ප්‍රාදේශීය සභාවක් වෙත අනුමැතිය සඳහා එවැනි ඉල්ලීමක් ලද විට එම ඉල්ලීම ලැබී දින 14ක් තුළ ඒ සඳහා අනුමැතිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ යුතු අතර අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කරයි නම් ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා හේතු ඉදිරිපත් කළ යුතු ය.

03. මේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව ජල කර්මාන්ත හා ජල සම්පාදන ක්‍රමයක් කළමනාකරණය කිරීම ප්‍ර. මූ. ස. කාර්යය විය යුතු ය.

04. (1) පෞද්ගලික ජල සේවා සම්බන්ධතාවක් ලබා ගැනීමට අපේක්ෂා කරන යම් තැනැත්තෙකු, ප්‍රදේශයේ ප්‍ර.මූ.ස. විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට එම සංවිධානය වෙත ඉල්ලුම් කළ යුතු ය.

(2) ප්‍ර. මූ. ස. විසින් ජල සේවා සම්බන්ධතාව ලබාදීම හෝ තත්කාර්ය සඳහා හේතු වාර්තාගත කොට එකී ඉල්ලීම නිශ්ප්‍රභා කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) එම ජල සම්බන්ධතාව ලබාදීම මගින් ප්‍රදේශයේ අඛණ්ඩ සහ විධිමත් ජල සැපයුමට බාධාවක් වන බව ප්‍ර. මූ. ස මතය වන්නේ නම්, වෙනත් හේතු අතර එම හේතුව මත එම සංවිධානය විසින් මේ අතුරු ව්‍යවස්ථා යටතේ පෞද්ගලික ජල සම්බන්ධතාවක් සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(4) (අ) ප්‍ර. මූ. ස. විසින් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එම ප්‍රතික්ෂේප කිරීම හේතු සහිතව, එකී ඉල්ලීම ලැබී දින දාහතරක් ඇතුළත ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ආ) ප්‍ර. මූ. ස. විසින් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එකී තීරණයෙන් අතෘප්තියට පත් පාර්ශවයට අදාල ප්‍රාදේශීය සභාව වෙත ඒ පිළිබඳව අභියාචනාවක් ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) එවැනි අභියාචනාවක් ලද විට ඒ පිළිබඳ සුදුසු පරීක්ෂණ සිදුකර අභියාචනාව ලැබී දින දාහතරක් ඇතුළත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් උචිත විධාන නිකුත් කළ යුතු ය.

(5) ප්‍ර. මූ. ස. විසින් ජල සම්බන්ධතාව ලබා දීමට තීරණය කරන ලද්දේ නම්, එම ජල සම්බන්ධතාව ලබා දීමට පෙර, මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් නියම හා කොන්දේසි වලට යටත්ව ප්‍ර. මූ. ස විසින් ඉල්ලුම්කරු සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

(6) ජල සම්බන්ධතාව ලබාදීම සඳහා ප්‍ර. මූ. ස. විසින් ඇස්තමේන්තු කරනු ලබන වියදම් ඉල්ලුම්කරු විසින් ප්‍ර. මූ. ස. වෙත ගෙවනු ලැබිය යුතු ය.

(7) (අ) අවස්ථාවෝචිත පරිදි, නව ජල සම්බන්ධතාවක් ලබාදීමේ දී හෝ පවත්නා සම්බන්ධතාවයක කිසියම් වෙනස් කිරීමක් සිදු කිරීමේ දී , ඉල්ලුම්කරුවකු විසින් ගෙවිය යුතු වියදම් දැරීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, විශේෂිත මානුෂික හේතු මත ප්‍ර. මූ. ස. විසින් එකී වියදම් ගෙවීමෙන් ඉල්ලුම්කරු නිදහස් කරනු ලැබිය හැකි ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් නිදහස් කිරීම සඳහා වූ තීරණයක් මහා සභා රැස්වීමකදී ගනු ලැබිය යුතු ය.

05. (1) මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යය සඳහා පහත සඳහන් තැනැත්තන් අතරින් සමන්විත වන ජල කර්මාන්ත කාර්මිකයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියාපදිංචි කළ යුතු ය.

(අ) ප්‍ර. මූ. ස. සමාජිකයන් වන්නා වූ ද අදාළ කාර්ය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබා ඇති සහ ප්‍රමාණවත් නිපුණතා අත්කර ගෙන ඇති තැනැත්තන්,

(ආ) ජල කර්මාන්ත කාර්මිකයකු වශයෙන් පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන තැනැත්තන්,

(ඇ) අදාළ නිපුණතා වර්ගය සම්බන්ධයෙන් පිළිගත් කාර්මික විද්‍යාලයක් හෝ කාර්මික ආයතනයක් විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන තැනැත්තන්,

(ඈ) ජල සම්පාදන හා ජල කර්මාන්ත පිළිබඳ නිපුනත්වයක් ඇති බවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන තැනැත්තන්,

(2) ජල කර්මාන්ත කළමනාකරණය පිළිබඳ සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකු හෝ (1) වන ඡේදයේ සඳහන් පළපුරුද්ද හා සුදුසුකම් ඇති තැනැත්තන් යම් පෞද්ගලික ආයතනයක් විසින් සේවයේ නියුක්ත කර ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා විසින් එම පෞද්ගලික ආයතනය ජල කර්මාන්ත කාර්මිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(3) (අ) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි කරනු ලබන ජල කර්මාන්ත කාර්මිකයන්ගේ ලේඛනයක් ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් එකී ලියාපදිංචි කිරීමේ ලේඛනයේ පිටපතක් හෝ එම ලේඛනයට පසුව සිදු කරනු ලබන වෙනස් කිරීම් හෝ සංශෝධන වහාම අදාල ප්‍ර. මූ. ස. වෙත යවනු ලැබිය යුතු ය.

06. (1) (අ) පවත්නා ජල සම්පාදන ක්‍රමයක් දීර්ඝ කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කිරීමට පෙර ප්‍ර. මූ. ස. විසින් ජල කර්මාන්ත කාර්මිකයකු ලවා ඒ පිළිබඳ ශක්‍යතා වාර්තාවක් ලබා ගත යුතු අතර එකී ශක්‍යතා වාර්තාව සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මගින් ප්‍රාදේශීය සභාවේ කාර්මික සේවා කමිටුවේ අනුමැතිය ලබාගත යුතු ය.

(ආ) ප්‍රාදේශීය සභාවේ කාර්මික සේවා කමිටුව ඒ සඳහා අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කරයි නම් ඒ සඳහා හේතු දැක්විය යුතුය.

(ඇ) එවැනි ඉල්ලීමක් ලැබී දින දහ හතරක් ඇතුලත එම වාර්තාව සැපයීම ජල කර්මාන්ත කාර්මිකයාගේ කාර්යය විය යුතු ය.

(2) පෞද්ගලික ජල සේවා සම්බන්ධතාවක් සැපයීමේ දී ප්‍ර. මූ. ස. විසින් ප්‍රමාණවත් පළපුරුද්ද ඇති තැනැත්තකු සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු අතර ජලනල එලීම සහ ඊට අදාල වෙනත් කටයුතු කලින් කල පරීක්ෂා කිරීම සඳහා ජල කාර්මිකයකුට නියම කරනු ලැබිය යුතු ය.

07. (1) ප්‍ර. මූ. ස. සහ ඉල්ලුම්කරුවකු අතර එළඹ ඇති ගිවිසුමේ සඳහන් කාර්ය සඳහා හැර, වෙනත් කිසිදු කාර්යයක් සඳහා එම තැනැත්තා විසින් පෞද්ගලික ජල සම්බන්ධතාවයකින් ලබා ගන්නා ජලය පාවිච්චි නොකළ යුතු ය.

(2) ප්‍ර. මූ. ස. විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන ක්‍රමයකින්, මේ අතුරු ව්‍යවස්ථාවලට පටහැනි ආකාරයට කිසිම තැනැත්තකු විසින් ජල සම්බන්ධතාවක් ලබා ගැනීම හෝ ජලය පාවිච්චි කිරීම හෝ නොකළ යුතු ය.

(3) යම් අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් (1) වන ඡේදයේ හෝ (2) වන ඡේදයේ විධිවිධාන කඩකර ඇතැයි ප්‍ර. මූ. ස. විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, එම ප්‍ර. මූ. ස. විසින් එකී ජල සම්බන්ධතාව විසන්ධි කරනු ලැබිය හැකි අතර ඒ බව විසන්ධි කිරීමට හේතු සහිතව ප්‍රාදේශීය සභාව වෙත වාර්තා කිරීම කළ යුතු ය.

08. ජල සම්පාදන ක්‍රමයක ජල නල එළීමේ දී :–

(1) යම් කසල කාණුවකට, අගලකට හෝ අසූචි වලකට හෝ ඊට සම්බන්ධ මනු වලකට, කිසියම් භස්ම වලකට හෝ පෝර වලකට හෝ අප ජලය ගලායන කාණුවකට හෝ වැසිකිළි වලකට හෝ එවැන්නක් මැදින් හෝ හරහා හෝ වැටෙන පරිදි හෝ ස්පර්ශ වන පරිදි කිසිම ජල නලයක් නොයෙදිය යුතු ය. නොවැළැක්විය හැකි අවස්ථාවල දී හැර, එවැනි යම් නලයක් යම් අපවිත්‍ර පසක් මැදින් හෝ හරහා එළීම හෝ එම නල ඉක්මනින් දරා යාමට හේතු විය හැකි යම් හානිකර ද්‍රව්‍යයක් තුලින් යෙදීම හෝ ඒවා ස්පර්ශ වී තිබීමට හෝ සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) නොවැළැක්විය හැකි අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන, ඉහත (1) වන ඡේදයේ සඳහන් උපමාන වලට අනුකූලව ක්‍රියාකළ නොහැකි නම්, පිටින් මල බැඳීම වලක්වන වෙනත් බටයක් තුළින් එකී ජල නල යෙදීමෙන් හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් මගින් එවැනි ද්‍රව්‍ය එකී ජල නලය සමග ස්පර්ශ වීම වළක්වනු ලැබිය යුතු ය.

09. ජල සම්පාදන ක්‍රමයක භාවිතා කරන ජල නල සහ උපාංග, දෙවන උප ලේඛනයේ සඳහන් ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

10. අවශ්‍යතාවක් පැන නගින කවර හෝ අවස්ථාවක දී ප්‍ර. මූ. ස. විසින් මහා සභා රැස්වීමකදී ජල ගාස්තු ක්‍රමය තීරණය කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම කරනු ලැබිය හැකි අතර එකී තීරණ හා ප්‍රතිශෝධනය කිරීම් ප්‍රාදේශීය සභාවේ මහ සභාවෙන් අනුමත කරවා ගත යුතුය.

11. (1) ජල සම්පාදන ක්‍රමයකින් යම් පරිශ්‍රයකට සපයන ජලය මැනීම සඳහා ජල මාපකයක් භාවිතා කරනු ලබන අවස්ථාවක, එවැනි ජල මාපක සියල්ල සැපයීම් හා සවි කිරීම ප්‍ර. මූ. ස. විසින් කරනු ලැබිය යුතු ය.

(2) ජල මාපකයක ඕනෑම අලුත්වැඩියාවක් ප්‍ර. මූ. ස. විසින් සිදු කළ යුතු අතර ඒ සඳහා වන වියදම්, ජලය ලබා ගන්නා පරිශ්‍රයේ හිමිකරු හෝ පදිංචිකරු විසින් දැරිය යුතු ය.

(3) (1) වන ඡේදයේ සඳහන් පරිදි ජලය මැනීම ජල මාපකයක් යොදා ගනු නොලබන අවස්ථාවක, ගෙවිය යුතු ගාස්තු ක්‍රමය අදාල ප්‍ර. මූ. ස. යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය යුතු ය.

12. කිසියම් මාසයක ජල පරිභෝජනය ඒ මාසයට අදාළව, එකී මාසය ආරම්භයේ දී පිළිවෙලින් සටහන් කරන ප්‍රථම මාපක කියවීම සහ අවසාන මාපක කියවීම අතර වෙනස සැළකිල්ලට ගෙන පහත සඳහන් පරිදි ගණන් බැලිය යුතු ය.

(1) අළුතින් සවි කරන ලද මාපකයක් සම්බන්ධයෙන් වන විට, ප්‍රථම කියවීම යනු එම මාපකය අළුතින් සවිකරන ලද අවස්ථාවේදී තිබුණ කියවීම වන අතර, ඊට පසු අවස්ථාවල දී පෙරාතුවම වූ මාසය සඳහා වූ අවසාන කියවීම, ප්‍රථම කියවීම වන්නේ ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා "අළුතින් සවිකරණ ලද මාපකය" යන්නට අලුත්වැඩියාවකින් පසු සවිකරණ ලද මාපකයක් හෝ අලුත්වැඩියා කාලය තුළ තාවකාලිකව සවි කරන ලද මාපකයක් ද අදහස් වේ.

(2) යම් මාසයක් සඳහා වූ අවසාන කියවීම වනුයේ එම මාසය අවසන් වීමෙන් පසුව දින දහයක් ගත වීමට පෙර යම් දිනයකදී ගනු ලබන කියවීම වේ. කෙසේ ද වුවද, අළුත්වැඩියාවක් සඳහා මාපකයට ඉවතට ගෙන යන ලදුව එකී කාලය තුල දී අවසාන කියවීම ලබා ගැනීමට නොහැකි වූයේ නම්, අවසාන කියවීම වනුයේ එම මාපකය ඉවතට ගෙන යාමට පෙර ලබාගත් කියවීම වේ. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා "අවසාන කියවීම" යන්නට තාවකාලිකව සවි කරන ලද මාපකයක් නැවත ඉවත් කරන අවස්ථාවේදී ලබාගත් කියවීම ද ඇතුළත් වේ.

(3) කිසියම් මාසයක් තුල දී යම් පරිශ්‍රයක මාපක එකක් හෝ ඊට වැඩි ගණනක් පාවිච්චි කර ඇත්නම්, එම මාසය සඳහා පරිභෝජනය කරන ලද ජල ප්‍රමාණය වනුයේ, මේ අතුරු ව්‍යවස්ථාවේ (1) සහ (2) ඡේදවලට අනුකූලව ගණනය කරනු ලබන පරිදි අදාල මාපකවල පෙන්නුම් කර ඇති ජල ප්‍රමාණවල එකතුව වේ.

(4) අළුත්වැඩියාවක් සඳහා මාපකයක් ඉවත්කර ගනු ලැබූ විට දීර්ඝ කාලයක් සඳහා මාපකයක් ක්‍රියා විරහිතව ඇති විට සහ තාවකාලික මාපකයක් සැපයීමට ප්‍ර. මූ. ස ට නොහැකි වන අවස්ථාවක , මාසික ජල පරිභෝජනය තක්සේරු කළ යුත්තේ කලින් මාසවල ජල පරිභෝජනය පදනම මත ය.

13.(1) සෑම මාසයකම අවසානයේදී මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව ප්‍ර. මූ. ස. විසින් බිල් පත්‍රයක් පිළියෙල කිරීම සහ එය පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදීම නිත්‍යානුකූල වන අතර ප්‍ර. මූ. ස. විසින් නියම කර ඇති කාලය තුල දී එම බිල් පත්‍රය සඳහා මුදල් ගෙවීම එම අයිතිකරු හෝ පදිංචිකරුගේ කාර්යය වන්නේ ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් බිල් පත්‍රයේ කිසියම් ගණනය කිරීමක් දෝෂ සහිත බව පාරිභෝගිකයකුට හැඟී යන්නේ නම්, බිල්පත්‍රය සංශෝධනය කරන ලෙස ඔහු විසින් ලිඛිත ඉල්ලීමක් කළ හැකි ය. ප්‍ර. මූ. ස. විසින් එම ඉල්ලීම පිළිබඳව හැකි ඉක්මණින් පරීක්ෂා කර ස්වකීය තීරණය පාරිභෝගිකයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

14. (1) යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට තම පරිශ්‍රයේ ඇති මාපකයේ නිරවද්‍යතාව පිළිබඳව සැකයක් ඇත්නම්, එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත සහ ප්‍ර. මූ. ස. විසින් නියම කරනු ලබන පරීක්ෂණ ගාස්තුවක් කලින් ගෙවීම මත, අයිතිකරු හෝ පදිංචිකරු ඉදිරිපිට දී නැතහොත් තත්කාර්ය සඳහා එකී අයිතිකරු හෝ පදිංචිකරු බලය පවරනු ලබන තැනැත්තකු ඉදිරිපිට දී මාපකය, 05 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ජල කර්මාන්ත කර්මිකයකු ලවා පරීක්ෂා කරවීමට ප්‍ර. මූ. ස. කටයුතු සලස්වනු ලැබිය යුතු ය. එකී පරීක්ෂණයේ ප්‍රතිපලය, ප්‍ර. මූ. ස. සහ අයිතිකරු හෝ පදිංචිකරු කෙරෙහි අනුගම්‍ය විය යුතු අතර එකී පරීක්ෂණ ප්‍රතිඵල අනුව මාපකය නිවැරදි කරනු ලැබිය යුතු ය.

(2) මාපකයේ පෙන්නුම් කරන ජල ප්‍රමාණය නිවැරදි වන අවස්ථාවක හෝ නියම වශයෙන් සපයන ලද ජල ප්‍රමාණයට වඩා සියයට දෙකකට වඩා අඩු වෙනසක් පෙන්නුම් කරන අවස්ථාවක ඉහත (1) වන ඡේදය යටතේ කලින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව ප්‍ර. මූ. ස. විසින් රඳවා තබා ගත යුතු ය.

(3) මාපකයේ පෙන්නුම් කරන ජල ප්‍රමාණය, නියම වශයෙන් සපයන ලද ජල ප්‍රමාණයට වඩා සියයට දෙකකට වැඩි වෙනසක් පෙන්නුම් කරන අවස්ථාවක, ඉහත (1) වන ඡේදය යටතේ කලින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව ඉල්ලුම්කරු වෙත ආපසු ගෙවනු ලැබියි යුතු ය.

(4) ඉහත (3) වන ඡේදයේ සඳහන් පරිදි මාපකයේ දෝෂයක් සොයා ගනු ලැබුවහොත්, එවිට ප්‍ර. මූ. ස. විසින් අදාල අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ බිල්පත් උචිත ආකාරයට වෙනස් කළ යුතු අතර අදාල මුදල් පසුව එළඹෙන මාසවල බිල්පත්වලට යෙදීමෙන් උචිත පරිදි ගිණුම් සකස් කළ යුතු ය.

15. ජල සම්පාදන ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා අතිරේක මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම්, ප්‍ර. මූ. ස. විසින් ඒ සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන දේශීය ආයෝජකයන් වෙතින් ලබාගත හැකි ය.

16. *මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනයෙන් පසුව :–*

(1) යම් පරිශ්‍රයකට සපයනු ලබන ජලයේ යම් කොටසක් රඳවා තබා ගැනීම සඳහා ප්‍ර. මූ. ස. විසින් තීරණය කරන ලද ජල ප්‍රමාණයට වඩා වැඩි ජල ධාරිතාවක් ඇති ජල ටැංකියක් හෝ රඳවනයක් එම පරිශ්‍රයේ සවිකිරීම හෝ ඉදිකිරීම නොකළ යුතු ය.

" "

(2) ප්‍ර. මූ. ස විසින් යම් පරිශ්‍රයකට සපයනු ලබන ජලය රඳවා තබාගැනීම සඳහා සවිකිරීමට හෝ ඉදිකිරීමට අපේක්ෂිත ජල ටැංකිවල හෝ නාන රඳවනවල ධාරිතාව, සැලැස්ම සහ සංඛ්‍යාව පිළිබඳව ප්‍ර. මූ. ස. යේ පූර්ව අනුමැතිය ලබා ඇත්නම් මිස, එම ජල ටැංකිය හෝ රඳවනය එම පරිශ්‍රයේ සවිකිරීම හෝ ඉදිකිරීම කරනු නොලැබිය යුතු ය.

17. යම් පරිශ්‍රයක ඇති පෞද්ගලික ජල සේවා සම්බන්ධතාවක කොටසක් වන යම් කරාමයකින්, නලයකින්, මාපකයකින් හෝ වෙනත් යම් උපාංගයකින් ජලය අපතේ යන අවස්ථාවක, ඊට ප්‍රතිකර්මයක් කරන ලෙස ප්‍ර. මූ. ස. විසින් අදාල අයිතිකරුට හෝ පදිංචිකරුට විධාන කළ හැකි ය. එසේ දැනුම් දීමෙන් පසු දින තුනක් ඇතුලත යම් ක්‍රියා මාර්ගයක් ගනු නොලැබුවහොත්, එවිට ප්‍ර. මූ. ස විසින් ජල සැපයුම විසන්ධි කළ හැකි අතර පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ජලය අපතේ යාමට හේතුව ඉවත් කරන තෙක් එම ජල සැපයුම නැවත සම්බන්ධ නොකළ යුතු ය.

18. ප්‍ර. මූ. ස. විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන ක්‍රමයේ කොටසක් වන යම් කරාමයකින්, නලයකින්, මාපකයකින් හෝ වෙනත් යම් උපාංගයකින් ජලය අපතේ යන බවට අදාල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පැමිණිල්ලක් ලැබෙන අවස්ථාවක, සභාපතිවරයා හෝ ඔහුගෙන් බලයලත් යම් නිලධරයෙකු ඒ පැමිණිල්ල පිළිබඳව විභාග කොට අදාල ප්‍ර. මූ. ස. වෙත හා ඊට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන් වෙත උචිත විධාන නිකුත් කළ යුතු ය.

19. ජල සම්පාදන ක්‍රම ඉදිකිරීමේ, නඩත්තු කිරීමේ සහ ව්‍යාප්ත කිරීමේ සියළු අදියරවල දී ප්‍ර. මූ. ස. විසින් යුක්තියේ සහ සාධාරණත්වයේ මූල ධර්ම පිළිපැදිය යුතු අතර, ජල සම්පාදන ක්‍රමයෙන් ජලය ලබාගන්නා සෑම ජන කොටසක් සහ සෑම පුද්ගලයෙක් සම්බන්ධයෙන් අවම ජල අවශ්‍යතා ලබා දිය යුතු ය.

20.(1) මේ අතුරු ව්‍යවස්ථා යටතේ ජලය සපයනු ලබන යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත කරනු ලබන නිසියාකාර දැනුම් දීමකින් පසු ප්‍ර. මූ. ස. විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද. යම් තැනැත්තකුට, ජල සැපයුමේ ජලනලවල සවි කිරීම්වල තත්ත්වය පරීක්ෂා කිරීම සහ ජලය අපතේ යාම හෝ ජලය අනිසි ලෙස පාවිච්චි කරන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා පෙරවරු 7.00 සිට පස්වරු 5.00 දක්වා කාලය තුල එම ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට ඇතුල්විය හැකි ය. කවර හෝ අවස්ථාවක දී සාධාරණ හේතුවක් නොමැතිව එකී බලයලත් තැනැත්තාට එම පරිශ්‍රයට ඇතුල්වීමට ඉඩ ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ වලක්වනු ලැබුවහොත්, ඒ පිළිබඳව ප්‍ර. මූ. ස. විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පැමිණිල්ලක් කරනු ලැබිය හැකි ය.

(2) ඉහත (1) වන ඡේදය යටතේ යම් පැමිණිල්ලක් ලැබුණු විට සභාපතිවරයා විසින් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, ප්‍ර. මූ. ස. බලයලත් නිලධරයකු ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට ඇතුල්වීමට ඉඩදීම අයුතු ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බවට නිගමනය කරනු ලබන්නේ නම්, එම ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට ජලය සැපයීම විසන්ධි කිරීම සඳහා සභාපතිවරයා විසින් ප්‍ර. මූ. ස. වෙත බලය පැවරිය හැකි ය.

(3) (2) වන ඡේදය යටතේ ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අදාල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත එම කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

21.(1) යම් ප්‍රාදේශීය සභාවක් විසින් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට පටහැනි නොවන ආකාරයට, යම් නිශ්චිත දිනයක සිට බලපවත්වන පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් “ ජල පෝෂිත ප්‍රදේශයක්” ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) එසේ නිශ්චයකරනු ලැබූ දින සිට, එකී ජල පෝෂිත ප්‍රදේශය තුළ ගස් කැපීම, කැලෑ එළි කිරීම, අපිරිසිදු කිරීම, සතුන් බැඳීම, ප්‍රාදේශීය සභාවේ විධිමත් අවසරයකින් තොරව එකී ප්‍රදේශයට ඇතුල්වීම හෝ එකී ප්‍රදේශය තුල ඇති ජල මූලාශ්‍රයකට හානිදායක විය හැකි කිසිදු සංවර්ධන කාර්යයක් සිදු කිරීම හෝ කිසිම තැනැත්තකු විසින් සිදු නොකළ යුතු ය.

(3) ජල සම්පාදන ක්‍රමයේ ජල මූලාශ්‍රයකට, ජල ටැංකියකට, ප්‍රධාන ජලනල මාර්ගයකට, බෙදා හැරීමේ ජලනල මාර්ගයකට,ජල සම්පාදන ක්‍රමයට අයත් කිසිදු ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට හෝ උපකරණ වලට හානි වන ආකාරයේ කිසිදු ක්‍රියාවක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(4) ජල සම්පාදන හා ජල කර්මාන්ත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවත්වාගෙන යාමට නීත්‍යානුකූල හේතුවක් නොමැතිව කිසිවකු විසින් හෝ බාධා කිරීම නොකළ යුතු ය.

22. ප්‍ර. මූ. ස. විසින් පවත්වාගෙන යනු ලබන ජල සම්පාදන ක්‍රම මගින් සපයන ජලයේ ගුණාත්මක බව තහවුරු කළ යුතු ය. ඒ වෙනුවෙන් උපයෝගී කරගනු ලබන ජල පෝෂිත ප්‍රදේශයන් සහ ජලාශයන් හි පවිත්‍රතාව, නිසි පැවැත්ම හා ආරක්ෂාව ප්‍රාදේශීය සභාව, ප්‍රදේශයේ ප්‍රජා මූල සංවිධාන සංසදය සහ අදාල ප්‍ර. මූ. ස. විසින් සුරක්ෂිත ආකාරයෙන් පවත්වා ගත යුතු අතර, ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හෝ යම් වෙනත් අදාල අධිකාරයක් විසින් හෝ නියම කරනු ලබන ප්‍රමිතීන්ට හා උපදෙස් වලට අනුව නිසි පියවර ගත යුතු ය.

23.(1) (*අ*) මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් ප්‍රථමයෙන් ම සමථකරණය මගින් බේරුම් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(*ආ*) යම් ආරවුලක් මතු ව වහාම එළඹෙන දින 30ක කාලයක් ඇතුළත එම ආරවුල සමථකරණය පිණිස ඉදිරිපත් කරනු ලැබිය හැකි යුතු ය.

(2) (1) වන ඡේදයේ කාර්යය සඳහා "ආරවුලක් " යන්නෙන්, ප්‍ර. මූ. ස. ලියාපදිංචි වී ඇති ප්‍රාදේශීය සභාව සහ ප්‍ර. මූ. ස. අතර හෝ ප්‍ර. මූ. ස. සහ වෙනත් යාබද ප්‍රාදේශීය සභාවක් අතර හෝ ප්‍රාදේශීය සභා දෙකක් අතර හෝ ප්‍ර. මූ. ස. දෙකක් අතර හෝ ප්‍ර. මූ. ස. සහ පාරිභෝගිකයෙකු අතර ඇති වන ආරවුලක් අදහස් වේ.

(3) (1) වන හා (2) වන ඡේදවල සඳහන් ආරවුලක් සමථකරණය මගින් බේරුම් කිරීම සඳහා සමථකරු, ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වන අතර, එම ආරවුල සමථකරු වෙත යොමු කිරීම පරිශ්වයන්ගෙන් යම් පාර්ශවයක කාර්යය වන්නේ ය.

(4) ආරවුලේ ස්වභාවය අනුව, ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් සමථකරුවකු ලෙස වෙනත් යම් නිලධරයකු නම් කරනු ලැබිය හැකි ය.

(5) සමථකරුගේ තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු එම තීරණයෙන් අනතුරුව වහාම එළඹෙන දින තිහක කාලය ඇතුළත එම තීරණයට එරෙහිව පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

24. (1) මේ අතුරු ව්‍යවස්ථාවල යම් විධිවිධානයන් කඩකරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර, මහෙස්ත්‍රාත් අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. එකී කඩ කිරීමේ වරද දිගටම කරගෙන යන අවස්ථාවක, අධිකරණය විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එකී වරද කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් හෝ භාරදීමෙන් පසු එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

25. *මේ අතුරු ව්‍යවස්ථාවල කාර්ය සඳහා :-*

" අයිතිකරු හෝ පදිංචිකරු" හෝ " පාරිභෝගිකයා" යන්නෙන් මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන ක්‍රමයකින් ජල සැපයුමක් ලබාගෙන ඇති පරිශ්‍රයක, නිත්‍යානුකූල අයිතිකරු හෝ එහි පදිංචිකරු හෝ පරිශ්‍රය ප්‍රයෝජනයට ගන්නා අයකු හෝ අදහස් වේ.

" ජල පෝෂිත ප්‍රදේශය" යන්නෙන් තත්කාර්ය සඳහා තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් හඳුනාගනු ලබන්නාවූ ද ජල මූලාශ්‍රයට ලැබෙන ජල සැපයුම සංවර්ධනය කිරීමට අවශ්‍ය භූගෝලීය ප්‍රදේශය වශයෙන් අදාල ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්තා වූ හෝ ජල මූලාශ්‍රයට ජලය සපයන ප්‍රදේශය බවට තීරණය කරනු ලැබිය හැකි වූ හෝ ප්‍රදේශයේ යම් වෙනසක් සිදු වුවහොත් ජල මූලාශ්‍රයට ජලය සැපයීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති විය හැකි ප්‍රදේශයක් ලෙස සැලකිය හැකි වූ ද, භූගෝලීය ප්‍රදේශයක් අදහස් වේ.

" ජල සම්පාදන හා ජල කර්මාන්ත " යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ (xiii ) ඡේදයේ ඊට ලබා දී ඇති අර්ථය ම අදහස් වේ.

" ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය" යන්නෙන් 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අදහස් වේ.

" පෞද්ගලික ජල සැපයුම" යන්නට, විකිණීම හෝ කුලියට දීම පිණිස අශ්වයන් හෝ ගවයන් හෝ වෙනත් සතුන් හෝ රථවාහන හෝ තබාගෙන ඇතිවිට, ඒ අශ්වයන් හෝ ගවයන් හෝ වෙනත් සතුන් හෝ රථවාහන හෝ සේදීම සඳහා වතුර හෝ වතුර මලක් සඳහා හෝ පිහිනුම් තටාකයක් සඳහා හෝ සැරසිලි සඳහා හෝ යාන්ත්‍රික කාර්ය සඳහා හෝ වාරිමාර්ග කටයුතු සඳහා හෝ කෘෂිකාර්මික කටයුතු හෝ ජලය ප්‍රධාන මූල්‍ය ලෙස භාවිත කරන යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ අවශ්‍ය ජලය ඇතුළත් නොවේ.

"ප්‍රජා මූල සංවිධානය" යන්නෙන්, ජල සම්පාදනය සහ ජල කර්මාන්ත සේවා සැපයීමේ කාර්යය සඳහා හා ඒවායේ තිරසාර කළමනාකරණය සඳහා පිහිටුවා ගනු ලැබූ සහ අදාල නීතිය යටතේ යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ සංස්ථාවක් වන්නාවූ ද පාරිභෝගික ප්‍රජාව නියෝජනය කරන්නාවූ ද, සංවිධානයක් අදහස් වේ.

" "

“ ප්‍රජා මූල සංවිධානය සංසදය ” යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටුවා ගෙන ඇති එක් එක් ප්‍රජා මූල සංවිධානයේ නියෝජිතයන් සහිතව සාමූහිකව පිහිටුවා ගන්නා ලද සංවිධානයක් අදහස් වේ.

*පළමු වන උපලේඛනය*

*03 වන අතුරු ව්‍යවස්ථාව*

**ජල සම්පාදන ක්‍රමයක් කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු පිළිවෙත්**

(i) සෑම ප්‍ර. මූ. ස. විසින් ම තම සංවිධානය විසින් අයකරනු ලබන මුදල් සම්බන්ධයෙන් ලදුපතක් නිකුත් කළ යුතු අතර, ඒ කාර්යය සඳහා 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(ii) රුපියල් සියයට වඩා වැඩි වූ සියළුම ගෙවීම් චවුචර් මාර්ගයෙන් සිදුකළ යුතු ය.

(iii) සෑම ප්‍ර. මූ. ස. විසින් ම සාමාන්‍ය ලේජරයක්, ලැබීම් සහ ගෙවීම් සටහන් කළ හැකි මුදල් පොතක්, සුළු මුදල් පොතක් සහ වට්ටෝරු භාණ්ඩ ලේඛණයක් පවත්වාගෙන යා යුතු ය.

(iv) (අ) ප්‍ර. මූ. ස. සියලුම ගිණුම් ස්වාධීන විගණකවරයකු හෝ විගණන සමාගමක් විසින් වාර්ෂිකව විගණනය කළ යුතු අතර, එම වාර්තා අදාල ප්‍රදේශයේ ප්‍රජා මූල සංවිධාන සංසදයට, අදාල ප්‍රාදේශීය සභාවට සහ ප්‍ර. මූ. ස. විධායක කමිටු රැස්වීමට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) අදාල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට අවශ්‍යය යැයි හැඟී යන ඕනෑම විටක අදාල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් ප්‍ර. මූ. ස. හි ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමයට අදාල සියලුම ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ පරීක්ෂා කර "ප්‍ර. මූ. ස." වෙත උචිත විධාන නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය.

(v) ප්‍ර. මූ. ස. හි විසින් ජංගම බැංකු ගිණුමක් පවත්වාගෙන යායුතු අතර, එම ගිණුමේ මාසික සැසඳුම් ඊළඟ මාසයේ පහළොස්වන වන දිනට පෙර සකස් කළ යුතුය.

(vi) ජල පාරිභෝගිකයන්ගේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(vii) ප්‍ර. මූ. ස. විසින් නියම කරන ඇති ජල සේවා සැපයීමේ නියමයන් සපුරාලීමේ අනුපිළිවෙල අනුව ජල සේවා සැපයුම් ලබා දිය යුතු ය.

(viii) ජල සම්පාදන ක්‍රමය කළමනාකරණය කරන ප්‍ර. මූ. ස. මගින් මාසික ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතු ය. තවද "ප්‍ර. මූ. ස." විසින් "ප්‍ර. මූ. ස." හි ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමයට අදාල සියලුම ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ වාර්ථාවක් මාස තුනකට වරක් අදාල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමද සිදු කළ යුතු ය.

(ix) 14 (1) වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන මගින් සලසා ඇති පරීක්ෂණ ගාස්තුව එවැනි විභාග කිරීමක් සඳහා වූ සත්‍ය වියදමක් විය යුතු අතර, එය අඩු ආදායම්ලාභී තැනැත්තකු විසින් වුව ද ගෙවිය හැකි සාධාරණ මුදලක් විය යුතු ය.

(x) ජල සම්පාදන ක්‍රමයට අදාලව ප්‍ර. මූ. ස. විසින් මිළ දී ගෙන ඇති හෝ ප්‍රාදේශීය සභාව විසින් හෝ වෙනත් යම් සංවිධානයක් විසින් ප්‍රදානය කරන ලද හෝ ණයක් වශයෙන් දෙන ලද ;

(අ) සියලුම ස්ථිර වත්කම් සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනයක් ද,

(ආ) සියළුම ප්‍රාග්ධන වත්කම් සඳහා වට්ටෝරු භාණ්ඩ ලේඛනයක් ද,

එම ප්‍ර. මූ. ස. විසින් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර, මේ උපලේඛනයේ iv වන ඡේදයේ සඳහන් විගණනයට පෙර වාර්ෂිකව පරීක්ෂා කිරීමෙන් පසු සත්‍යායන වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

*දෙවන උපලේඛනය*

*09 වන අතුරු ව්‍යවස්ථාව*

**ජල සම්පාදන ක්‍රමයක භාවිත කරනු ලබන නල සහ උපාංග**

(i) සියළුම පොලි වයිනයිල් ක්ලෝරයිඩ් (පී. වී. සී. ) ජලනල ශ්‍රී ලංකා ප්‍රමිති අංක 147 : 1993 ට හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට අනුකූළ විය යුතු ය. ශ්‍රී ලංකාවේ නිපදවන ලද ජලනල වල SLS ලකුණ සටහන්ව තිබිය යුතු ය. පොලී වයිනයිල් ක්ලෝරයිඩ් (පී. වී. සී.) ජලනල වල පිරිවැද්දුම් සහ සවිකිරීම් ශ්‍රී ලංකා ප්‍රමිති 659 : 1993 ට හෝ බ්‍රිතාන්‍ය ප්‍රමිති 4346 : 1970 හි , I වන හා II වන කොටසට සහ ඒවාට කලින් කල කෙරෙන සංශෝධනයන්ට අනුකූල විය යුතු ය.

(ii) ජල සේවා සම්බන්ධතාවන් ඉදි කිරීම සඳහා පාවිච්චි කරනු ලබන සියලුම පොලි එතිලීන් ජල නල 6572 : 1985 දරන බ්‍රිතාන්‍ය ප්‍රමිතියට හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට හෝ වෙනත් ජාතික ප්‍රමිතියකට අනුකූල විය යුතුය. පොළොව මතුපිට පාවිච්චි කරනු ලබන ජලනල 6730 : 1986 දරන බ්‍රිතාන්‍ය ප්‍රමිතිය හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට අනුකූල විය යුතු ය.

(iii) ජල සේවා සම්බන්ධතාවන් ඉදි කිරීම සඳහා පාවිච්චි කරනු ලබන සියලුම ගැල්වනයිස් සිද්ධ යකඩ ජලනල 1387 : 1985 දරන බ්‍රිතාන්‍ය ප්‍රමිතියට හා ඊට කලින් කල කෙරෙන සංශෝධනයන්ට අනුකූල විය යුතු ය.

04 - 196

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.